විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

# විගණන විමසුම-AUDIT QUERY- கணக்காய்வு விசாரணை

විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No. : සිරීඑන්/සී/එස්ටිසී/2016/06

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue : 2016 දෙසැම්බර් 06 දින

Addressed to : සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතටයි

විෂයය / Subject / விடயம் : ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය - භෞතික විගණනය

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගනන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

---

2016 පෙබරවාරි 04 දිනැති අංක අමප/16/0082/736/002 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ වූ වෙනම ආයතනයක් ලෙස ප්‍රතිසංවිධානය කරන ලද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 03 සිට නොවැම්බර් 17 දක්වා වූ කාල පරිච්ඡේදය තුල සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

1. මූල්‍ය ක්‍රියාකාරිත්වය

1.1 ගිණුම්කරණ පද්ධතිය

(අ) මෙම ආයතනය ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2016 ජනවාරි 26 දිනැති අංක MF/PF/CM/2016/12 දරන ගරු මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි 03 වැනි ඡේදය පරිදි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අවසාන වාර්ෂික වාර්තාවලට ඒකාබද්ධ කළ යුතු වෙනම ගිණුම් පොත්, ගනුදෙනු පිළිබඳව වෙනම වාර්තා ආයතනය පවත්වාගත යුතු යැයි නිර්දේශ කර තිබුණද, ආයතනය විසින් විගණිත දිනය වන විටත් එබඳු ගිණුම් පද්ධතියක් පවත්වා ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, ආයතනය විසින් එදිනෙදා මුදල් ගනුදෙනු සටහන් කිරීම සඳහා මුදල් පොතක් පමණක් පවත්වාගෙන ගොස් තිබුණ ද, මෙය විධිමත් ලෙස සකස්කරන ලද ලේඛනයක් නොවන බව නිරීක්ෂණය විය.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකතනය / தொலைபேசி / Telephone : 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail : oaggov@sltnet.lk

(ආ) ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉවත් කොට වෙනම ආයතනයක් ලෙස ඒකාබද්ධ කිරීමේදී ඒ වන විට පැවති වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් යන ගිණුම් වල ආරම්භක ශේෂයන් කිසිවක් විගණිත දින වන විටත් පොත් වලට ගෙන නොතිබුණි. ඒ අනුව ආයතනයේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් ගිණුම් ශේෂයන් හඳුනාගැනීමට අවශ්‍ය ලෙජර් ගිණුම් කිසිවක් ආයතනය විසින් නඩත්තු නොකිරීම හේතුවෙන් ආයතනයේ සමස්ථ මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ තොරතුරු හා ව්‍යාපෘතින්හි ලාභදායී හෝ අලාභදායී තත්ත්වයන් පිළිබඳව කළමනාකරණයට මෙන්ම විගණනයටද තොරතුරු කිසිවක් ඉදිරිපත් කල නොහැකිව තිබුණි.

(ඇ) මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි 04 වැනි ඡේදය අනුව ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය විසින් පවත්වාගෙන යනු ලබන පොත් සහ වාර්තා කලින් කල පරීක්ෂා කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට බලය ලබාදී තිබුණද, විගණිත දින වන විටත් එබඳු කිසිඳු අධීක්ෂණයක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමනාකරණය විසින් සිදුකොට නොතිබුණි.

(ඈ) වසර 10 ක පළපුරුද්දක් සහිත ගණකාධිකාරීවරියකට ආයතනය වැටුප් ගෙවමින් සිටියද, ඇයට එම තනතුරට අදාල රාජකාරි පවරා නොතිබුණු අතර පරිපාලන නිලධාරී පත්වීමක් ලබා තිබූ පරිපාලන නිලධාරියෙකු ගණකාධිකාරී තනතුරේ රාජකාරි කටයුතු ආවරණය කිරීමට යොදවා තිබුණි. මීට අමතරව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සහකාර මූල්‍ය කළමනාකරුවන් 05 දෙනෙකු හා අනෙකුත් කාර්ය මණ්ඩලය 12 දෙනෙකු වශයෙන් නිලධාරීන් 19 දෙනෙකු ... මූල්‍ය අංශයටඅනුබද්ධව රාජකාරියේ යොදවා තිබුණ ද, මූල්‍ය අංශයේ ගිණුම් හා වාර්තා නිසි පරිදි පවත්වා නොතිබුණි.

## 1.2 බැංකු ගිණුම් කටයුතු

(අ) ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධ වූ අංශයක් ලෙස පැවති අවස්ථාවේදී එම අංශය විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන ගොස් තිබූ අංක 1710 දරණ බැංකු ගිණුමෙහි 2016 වර්ෂය ආරම්භයේදී රු.මිලියන 12 ක හිතකර බැංකු ශේෂයක් පැවතියද, එම ආයතනය වෙනම ආයතනයක් ලෙස පිහිට වූ පසුව සිදු වී තිබූඅකාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය හේතුවෙන් එය

රු.මිලියන 146 ක බැංකු අයිරාවක් දක්වා පිරිහී තිබුණි. තවද, එම අයිරාව වෙනුවෙන් 2016 පෙබරවාරි මස සිට 2016 සැප්තැම්බර් දක්වා රු.මිලියන 9.75 ක අයිරා පොලියක්ද ආයතනය විසින් ගෙවා තිබුණි . විස්තර පහත පරිදි වේ.

| මාසය | බැංකු අයිරා පොළිය (රු.) |
|---|---|
| පෙබරවාරි | 3,554.72 |
| මාර්තු | 242,913.80 |
| අප්‍රේල් | 845,041.58 |
| මැයි | 1,438,077.76 |
| ජූනි | 1,464,039.98 |
| ජූලි | 1,794,229.38 |
| අගෝස්තු | 1,968,412.71 |
| සැප්තැම්බර් | 1,998,846.21 |
| | 9,755,116.14 |

(ආ) මාසිකව පිළියෙල කල යුතු බැංකු සැසඳුම් ලේඛනයද මාසිකව පිළිලෙ කරනු වෙනුවට පෙබරවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ මාස 08 ක බැංකු සැසඳුම් වාර්තා 2016 ඔක්තෝබර් මස පිළියෙල කොට තිබුණු අතර විගණිත දින වන විටත් බලය ලත් නිලධාරියෙකු විසින් ඒවා අනුමත කොට නොතිබුණි. තවද, මුදල් පොතේ ආරම්භක ශේෂය ඇතුලත් කර නොතිබුණු හෙයින් බැංකුවට ලද චෙක්පත් හා ගෙවීම් කරන ලද චෙක්පත් ආශ්‍රයෙන් එම සැසඳුම් පිළියෙල කොට තිබුණි. එබැවින් ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 1.3 නිරවුල් නොකල අත්තිකාරම්

### 1.3.1 විශේෂ අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(අ) දින 14 ක් ඇතුලත පියවීමේ පදනම මත ලබාදෙනු ලබන විශේෂ මුදල් අත්තිකාරම් අතුරින්, 2016 ජනවාරි මස සිට ඔක්තෝබර් මාසය දක්වා ගෙවීම් වවුචර් 14 කින් ගෙවා තිබූ රු.4,370,000 ක් වූ විශේෂ මුදල් අත්තිකාරම් විගණිත දිනය වූ 2016 නොවැම්බර් 20 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මේ අතුරින් රු. 3,020,000 ක අත්තිකාරම් මුදල් සඳහා වූ ගෙවීම් වවුචර සභාපති විසින් අනුමත කොට ඔහු විසින්ම මුදල් භාරගෙන තිබූ ඒවා බවද නිරීක්ෂණය වූ බැවින් රජයේ අරමුදල් නිසි අධිකාරියෙන් තොරව තමා සන්තකයේ තබා ගැනීම පිළිබඳ විධිමත් පරීක්ෂණ සිදුකළ යුතුව තිබුණි. (විස්තර ඇමුණුම 01 හි දැක්වේ)

(ආ) විශේෂ මුදල් අත්තිකාරම් ලබාදීමේ ක්‍රියා පටිපාටියේදී පහත සඳහන් දුර්වලතාවයන් තිබූ බව නිරීක්ෂණය විය.

(i) අත්තිකාරම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් නොකර අත්තිකාරම් මුදල් ලබා ගැනීම.

| දිනය | චෙක්පත් අංකය | වවුචර් අංකය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2016.02.12 | 038547 | 0183 | 150,000 |
| 2016.07.15 | 612902 | 1044 | 100,000 |

(ii) අත්තිකාරම් මුදල්, පියවීමේ වගකීම භාරගත් නිලධාරියාගේ පෞද්ගලික බැංකු ගිණුමට බැර කර තිබීම.

වවුචර් අංකය - 312 වටිනාකම - රු:250,000

උදා - ඉහත වටිනාකම කොමර්ෂල් බැංකුවේ පී.ජේ.මුතුකුමාරණ මහතාගේ අංක 8137012680 දරන ගිණුමට බැර කිරීම.

(iii) අත්තිකාරම් අයදුම්පත්‍රය විධිමත්ව සම්පූර්ණ කර නොතිබීම. එනම්,

- කිසිදු අත්තිකාරම් අයදුම් පත්‍රයක අනුක්‍රමික අංකය සඳහන් කර නොතිබීම.
- අයදුම්කරුගේ සේවා අංකය හා අත්සන යොදා නොතිබීම.

උදා :-

| වවුචර් අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 197 | 100,000 |
| 409 | 300,000 |
| 463 | 350,000 |
| 1057 | 20,000 |
| 1168 | 100,000 |
| 1352 | 700,000 |

- අත්තිකාරම් ගෙවීම් වවුචරයේ ගෙවීම අනුමත කිරීම නිලධාරීන් දෙදෙනෙකු විසින් සිදුකල යුතු වුවත්, එක් නිලධාරියෙකු පමණක් අනුමත කොට මුදල් ගෙවා තිබීම.

:

| වවුචර් අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 312 | 250,000 |
| 409 | 300,000 |
| 463 | 350,000 |

| | |
|---|---|
| 1352 | 700,000 |
| 1359 | 1,000,000 |
| 1480 | 500,000 |

- අත්තිකාරම් මුදල් ලබා ගැනීමට අදාල හේතූන් සඳහන් කර නොතිබීම.

| වවුචර් අංකය | වටිනාකම |
|---|---|
| | (රු.) |
| 409 | 300,000 |
| 463 | 350,000 |
| 1352 | 700,000 |

- මිලදී ගැනීමට නියමිත භාණ්ඩවල මිල ගණන් ඒ සඳහා බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබීම.

| වවුචර් අංකය | වටිනාකම |
|---|---|
| | (රු.) |
| 409 | 300,000 |
| 1168 | 100,000 |
| 1169 | 100,000 |
| 1480 | 500,000 |

- අත්තිකාරම් පියවීමේ වගකීම භාරගත් නිලධාරියාගේ සේවා අංකය, තනතුර, අත්සන හා දිනය යොදා නොතිබීම.

| වවුචර් අංකය | වටිනාකම |
|---|---|
| | (රු.) |
| 197 | 100,000 |
| 312 | 250,000 |
| 313 | 500,000 |
| 409 | 300,000 |

| | |
|---|---|
| 463 | 350,000 |
| 1057 | 20,000 |
| 1168 | 100,000 |
| 1169 | 100,000 |
| 1480 | 500,000 |

- මුදල් ගෙවීම නිර්දේශ කිරීමේදී නිර්දේශ කරන මුදල් ප්‍රමාණය සටහන් කර නොතිබීම හා බලයලත් නිලධාරියෙකු විසින් අදාල ගෙවීම නිර්දේශ කර නොතිබීම.

| වවුචර් අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 312 | 250,000 |
| 313 | 500,000 |
| 1057 | 20,000 |
| 1168 | 100,000 |
| 1169 | 100,000 |

- අත්තිකාරම් අයදුම් පත්‍රයේ සඳහන් මුදලට වඩා වැඩියෙන් අත්තිකාරම් මුදල් ලබා දී තිබීම.

  උදා :- ගෙවීම් වවුචර් අංක 1359 න් ගෙවා තිබූ අත්තිකාරම් මුදල රු. 1,000,000 වුවද ඒ සඳහා ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍ර තුනෙහි එකතුව රු. 820,082 ක් වී තිබීම.

| අයදුම්කරුගේ ණො අංකය | මුදල (රු.) |
|---|---|
| 200096 | 120,082 |
| 20200 | 300,000 |
| 20046 | 400,000 |
| | 820,082 |

(iv) චෙක්පත භාර ගැනීමේදී චෙක්පතෙහි වටිනාකම, දිනය, හැඳුනුම්පත් අංකය හා ලිපිනය යොදා නොතිබීම.

| වවුචර් අංකය | වටිනාකම (රු.) |
|---|---|
| 0045 | 200,000 |
| 197 | 100,000 |
| 313 | 500,000 |

(v) අත්තිකාරම් සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි ප්‍රතිපාදන ඉක්මවා ලබා දී තිබූ අත්තිකාරම් නිරවුල් කර නොතිබූ සේවකයින්ට නැවත අත්තිකාරම් ලබාදී තිබීම.

1.3.2 ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම්

(අ) 2006 ජනවාරි මස 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් නිකුත් කරන ලද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයේ විධි විධාන අනුව භාණ්ඩ මිලදී ගැනීමේදී මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 උපරිමයකට යටත්ව පමණක් අත්තිකාරම් ලබාදීම කළ යුතු වුවත්, ඊට පටහැනිව අදාල වටිනාකම අයකර ගැනීම සඳහා ඇප ගිවිසුමකින් තොරව භාණ්ඩ ලැබීමට පෙර ඇණවුම සමග භාණ්ඩ වල මුළු වටිනාකම චෙක්පත් මගින් අත්තිකාරම් ලෙස ලබාදීම ආයතනය විසින් සිදුකර තිබුණි.

(ආ) 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය පරිදි ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුලත එම අත්තිකාරම් පියවිය යුතු අතර එසේ නොපියවන අයට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය. එසේ වුවද, 2016 වර්ෂය තුළ ගෙවා තිබූ නමුත් විගණිත දිනය වූ 2016 නොවැම්බර් 11 දින වන විටත් නියමිත කාලපරිච්ඡේදය තුල පියවා නොතිබූ රු.1,794,218 ක් වූ අත්තිකාරම් පැවති බව විගණනයේදී

නිරීක්ෂණය වූ අතර එම අත්තිකාරම් දින 05 සිට දින 198 දක්වා නිරවුල් කිරීම ප්‍රමාද වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| දිනය | වවුචර් අංකය | වටිනාකම (රු.) | ප්‍රමාදය (දින) |
|---|---|---|---|
| 2016.03.23 | 381 | 105,700 | 198 |
| 2016.07.01 | 968 | 16,649 | 101 |
| 2016.07.04 | 972 A | 7,900 | 98 |
| 2016.07.04 | 972 | 47,051 | 98 |
| 2016.07.12 | 1011 | 28,362 | 90 |
| 2016.07.12 | 1026 | 192,800 | 90 |
| 2016.07.13 | 1032 | 9,301 | 89 |
| 2016.08.03 | 268772 | 192,806 | 68 |
| 2016.08.29 | 268903 | 476,740 | 42 |
| 2016.09.12 | 1333 | 28,362 | 29 |
| 2016.09.21 | 323279 | 621,245 | 20 |
| 2016.10.03 | 1440 | 51,302 | 8 |
| 2016.10.06 | 1462 | 16,000 | 5 |
| | | 1,794,218 | |

## 2. මානව සම්පත් කළමනාකරණය

### 2.1 පත්වීම් බලධාරියා නිශ්චිතව හඳුනාගත නොහැකි වීම

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ වෙනම ආයතනයක් ලෙස කළමනාකරණ කමිටුවක් යටතේ ස්ථාපිත කර තිබූ ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානයේ පත්වීම් බලධරයා නිශ්චිතව හඳුනාගත හැකි ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර, කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා පත්වීම් ලිපි අත්සන් කර තිබුණි.

2.2 අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් බඳවා ගැනීම

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වෙතම අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර මෙම ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ඒකාබද්ධව සිටියදී එම අංශයට අදාලව අනුමතව සිටි සේවක සංඛ්‍යාව 344 ක් බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2016 සැප්තැම්බර් 30 දිනට වූ මුළු සේවක සංඛ්‍යාව 722 ක් වූයෙන් කලින් අනුමත කොට ගෙන තිබූ සේවකයින් ඉක්මවා සේවකයන් 378 දෙනෙකු අතිරික්තව බඳවා ගෙන තිබුණි. එම සේවක සංඛ්‍යාව තුල ස්ථිර සේවකයින් 84 දෙනෙක්ද, කොන්ත්‍රාත් සේවකයින් 173 දෙනෙක්ද, අනියම් සේවකයින් 103 දෙනෙක්ද, පුහුණුවන සේවකයින් 16 දෙනෙක්ද, කාර්යය පදනම මත බඳවාගත් සේවකයින් 02 ක්ද සිටි බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත සේවකයන් බඳවා ගැනීම 2016 ජනවාරි 26 දිනැති අංක MF/PF/CM/2016/12 දරන මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි 02 වැනි ඡේදයට පටහැනිව ක්‍රියාකිරීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 පෙර දාතම් කර පත්වීම් ලිපි නිකුත් කිරීම

ආයතනයේ බඳවා ගැනීම් පටිපාටියට පටහැනිව අයදුම්පත් නොකැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් තොරව හා මානව සම්පත් අංශය දැනුවත් කිරීමකින්ද තොරව ව්‍යාපෘති සඳහා පුද්ගලයින් සේවයේ යොදවා ඔවුනට ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ඉක්මවා යමින් පෙර දාතම් කර පත්වීම් ලිපි ලබාදීම මාසිකව දිගින් දිගටම සිදුවන බව නිරීක්ෂණය වූ අතර, එසේ 2016 ඔක්තෝබර් මස සේවයේ යොදවාගෙන තිබූ පත්වීම් ලිපි නොමැති සේවකයින් 67 දෙනෙකු සිටි බව විගණනයේදී අනාවරණය විය. මෙම සේවකයින්ගෙන් 18 දෙනෙකුට නුපුහුණු සේවකයින් ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 2016 නොවැම්බර් 15 දින ලබාදුන් පත්වීම් ලිපි 18 ක් විගණනයේදී නිරීක්ෂණය කළ අතර මෙම පත්වීම් ලිපි මාස 1 ක් පමණ පෙර දාතම් කර තිබුණි. කෙසේ වුවද,මෙම පත්වීම් ලිපි පෙරදාතම් කිරීමට ආයතන සංග්‍රහයේ වන II පරිච්ඡේදයේ 10.1 වගන්තිය පරිදි ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ඉහත සඳහන් කල පරිදි දිගින් දිගටම නව සේවකයින් බඳවා ගැනීම, රු.මිලියන 145 ක බැංකු අයිරාවක් සහිතව පවත්වාගෙන යන හා මාසික වැටුප් හා වේතන වියදම එහි මුළු ආදායමෙන් සියයට 99 ක් වැනි ඉහළ මට්ටමක පවතින මෙවැනි ආයතනයකට දරාගත නොහැකි තත්ත්වයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.4 පත්වීම් ලිපි නොමැතිව සේවකයින් සේවයේ යොදවා ගැනීම හා ගෙවීම් කිරීම

ආයතනයේ බඳවා ගැනීම් පටිපාටිය අනුගමනය කරමින් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණ පවත්වා මෙම නිලධාරීන් පත්කර ගැනීම වෙනුවට ආයතනය ඉහළ කළමනාකරණය නියෝජනය කරන තනතුරු 03 ක් සඳහා 2016 වර්ෂයේ මාස කිහිපයක් වෙනුවෙන් උපදේශකයින් ලෙස නිලධාරීන් 03 දෙනෙකු පත්කොට තිබුණද, ඔවුනට පත්වීම් ලිපි ලබාදී නොතිබුණි. තවද, මෙම නිලධාරීන් සඳහා කළමනාකරණ කමිටු අනුමැතියකින් තොරව රු.1,125,000 ක් උපදේශක ගාස්තු ලෙස ගෙවීම් කොට තිබුණි. විස්තර පහත පරිදි වේ.

| තනතුර | විස්තරය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 2016 පෙබරවාරි සිට මැයි දක්වා (මාස 4 x 150,000) | 600,000 |
| ව්‍යාපෘති ඉංජිනේරු | 2016 මාර්තු සිට මැයි දක්වා (මාස 3 x 100,000) | 300,000 |
| ප්‍රමාණ සමීක්ෂක | 2016 මාර්තු සිට මැයි දක්වා (මාස 3 x 75,000) | 225,000 |
| | | 1,125,000 |

## 2.5 ඉහළ කළමනාකරණය සඳහා සේවකයින් බඳවා ගැනීම

### 2.5.1 සාමාන්‍යාධිකාරී තනතුර

පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(අ) ආයතනයේ සභාපතිගේ 2016 මැයි 10 දිනැති පත්වීම් ලිපිය මගින් 2016 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යය පදනම මත සාමාන්‍යාධිකාරීවරයෙකු බඳවාගෙන තිබුණද ඒ සඳහා අයදුම්පත් කැඳවීමක් හෝ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) මීට ඉහත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවයෙන් විශ්‍රාම ලබා වයස අවුරුදු 60 ඉක්මවා සිටි මෙම නිලධාරියා නැවත සේවයේ යෙදවීම ආයතන සංග්‍රහයේ 02 වන පරිච්ඡේදයේ 9.1 ඡේදයේ විධිවිධානයන් ඉක්මවා යාමක් වන අතර ආයතනය තුල ඉතා වගකිව යුතු ඉහළ කළමනාකරණ තනතුරක් වන සාමාන්‍යාධිකාරී තනතුරට කාර්යය පදනම මත පුද්ගලයින් බඳවා ගැනීම ආයතනයේ කාර්යය සාධනයට අහිතකර ලෙස බලපාන බව විගණනයේ නිරීක්ෂණයයි.

(ඇ) මෙම තනතුරට අදාල පත්වීම් ලිපිය ද ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 1.10 වගන්තියට පටහැනිව ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය රහිතව පෙරදාතම් කර තිබුණි.

### 2.5.2 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර

පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(අ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කල නිලධාරියා නැවත යන්ත්‍රෝපකරණ ආයතනය වෙත අන්තර්ග්‍රහණය කිරීමේදී කලින් තිබූ තනතුරට හා වැටුපට අන්තර්ග්‍රහණය කරනු වෙනුවට උපදේශකවරයෙකු ලෙස මාසිකව රු. 150,000 ක උපදේශන

ශාස්තුවක් යටතේ යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවයේ යෙදවීම විගණනයේදී මතභේදාත්මක තත්වයක පැවතුණි.

(ආ) 2016 ජුනි 21 දින නිකුත් කරන ලද පත්වීම් ලිපියකින් ස්ථිර සේවක පදනම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස මොහු නැවත පත්කර තිබූ අතර එම පත්වීම 2016 ජුනි 03 දින සිට පෙරදාතම් කොට තිබුණි.

2.5.3 කළමනාකරණ කමිටු ලේකම් පත්කිරීම

පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

(අ) ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් 2016 ජනවාරි 26 දිනැති අංක MF/PF/CM/2016/12 දරන මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්හි 05 වැනි ඡේදය පරිදි අඛණ්ඩතාව හා සමරූපිතාව සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ කළමනාකරණ කමිටු ලේකම් ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ ලේකම්ගේ සේවය ආයතනය විසින් ලබා ගත යුතු වුවද, එම නිර්දේශයට පටහැනිව යමින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සඳහා වෙනම කළමනාකරණ කමිටු ලේකම්වරියක් පත් කර තිබුණි.

(ආ) 2016 මැයි 10 දින නිකුත් කරන ලද පත්වීම් ලිපිය 2016 මාර්තු 01 දින සිට පෙරදාතම් කොට තිබුණද ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය පරිදි ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) අදාළ පත්වීම කුමන ස්වාභාවයක (ස්ථිර, කොන්ත්‍රාත්, අනියම්, කාර්යය පදනම මත ආදී) පත්වීමක්ද යන්න පත්වීම් ලිපියේ ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.3 ඡේදය පරිදි සේවයට පැමිණීමේදී හා පිටවීමේදී ආයතනයේ අදාල පැමිණීම් හා පිටවීම් ලේඛණයේ මෙම නිළධාරිනිය අත්සන් තැබීමකින් තොරව කළමනාකරණ කමිටු රැස්වීම්

පැවැත්වන දිනයන්ට පමණක් ඇය සේවයට පැමිණියද, රු.35,000 ක මාසික පාරිශ්‍රමිකයක් ගෙවා තිබුණි.

## 2.6 පාරිතෝෂික මුදල් ගෙවීම ප්‍රමාද වීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ 04 වැනි ඡේදය අනුව සේවය අවසන් වී දින 30 ක් ඇතුලත නියමිත පාරිතෝෂික මුදල් සේවකයාට මුදලින් ගෙවිය යුතු අතර ගෙවීම ප්‍රමාද වුවහොත් ප්‍රමාද වූ කාලය මත සියයට 10 සිට සියයට 30 දක්වා වූ දඩ මුදලක්ද සමග පාරිතෝෂික මුදල ගෙවිය යුතු වුවත්, 2016 වර්ෂය තුල විශ්‍රාම ගිය සේවකයින් 09 දෙනෙකුට හිමි රු. 2,929,409 ක පාරිතෝෂික මුදල් දින 27 සිට දින 219 දක්වා ගෙවීම් ප්‍රමාදකර තිබූ බව 2016 නොවැම්බර් 16 දින විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | සේවක අංකය | විශ්‍රාම ගිය දිනය | පාරිතෝෂික මුදල (රු.) | 2016.11.16 දිනට ප්‍රමාදය (දින) |
|---|---|---|---|---|
| 1 | M 17545 | 2016.03.07 | 252,230 | 219 |
| 2 | M 17716 | 2016.03.16 | 260,700 | 210 |
| 3 | M 17470 | 2016.03.28 | 443,612 | 198 |
| 4 | M 17925 | 2016.05.30 | 184,535 | 136 |
| 5 | M 12073 | 2016.07.30 | 205,530 | 76 |
| 6 | M 11036 | 2016.07.31 | 443,612 | 75 |
| 7 | M 11731 | 2016.08.31 | 274,390 | 46 |
| 8 | M 17457 | 2016.09.11 | 580,405 | 35 |
| 9 | M 11252 | 2016.09.19 | 284,395 | 27 |
| | | : | 2,929,409 | |

## 3. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා

### 3.1 වාහන මිලදී ගැනීම

2016 අප්‍රේල් 28 දිනැති අංක 002/2016 දරන කළමනාකරණ කමිටු වාර්තාව මගින් සින්ගල් කැබ් රථ 10 ක් ද, ඩබල් කැබ් රථ 05 ක් ද මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණු අතර සින්ගල් කැබ් රථ 05 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විවෘත මිල කැදවීම් සිදුනොකර අන්තර්ජාලයෙන් තෝරාගත් සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් 2016 මැයි 07 දින ලංසු කැඳවා තිබුණි. මෙම මිල කැදවීම් සත්‍ය වශයෙන්ම අදාළ ආයතන වෙත ලැබී තිබුණේ ද යන්න තහවුරු වී නොතිබුණි.

(a) M/S Ideal Motor (Pvt) Ltd
(b) M/S Associated Motorways (Pvt) Ltd
(c) M/S Toyota Lanka
(d) M/S Diesel & Motor Engineering PLC
(e) M/S United Motors PLC

එම සැපයුම්කරුවන් පස්දෙනාගෙන් සැපයුම්කරුවන් 03 දෙනෙක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

(a) M/S Ideal Motor (Pvt) Ltd
(b) M/S Diesel & Motor Engineering PLC
(c) M/S United Motors PLC

2016 ජුනි 22 දින ලංසු විවෘත කර තිබූ අතර, 2016 ජුනි 27 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මගින් සියළු පිරිවිතර සැසදෙන බැවින් අඩුම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවූ M/S Diesel & Motor Engineering PLC ආයතනයෙන් එකක් රු. 1,520,000 බැගින් ටාටා 207 RX සින්ගල් කැබ් රථ 05 ක් මිලදී ගැනීමට තාක්ෂණ ඇගයීම් කමිටුවෙ අනුමැතිය ලබා දී තිබුණි.

2016 ජුලි 07 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු වාර්තාවට අනුව ප්‍රසම්පාදන කමිටුව සැපයුම්කරු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකක් රු.1,435,000 බැගින් ටාටා 207 RX වර්ගයේ සිංගල් කැබ් රථ 05 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී තිබුණි.

කෙසේ වෙතත්, උක්ත කමිටුවන්හි නිර්දේශයන් අභිබවා යමින් 2016 අගෝස්තු 08 දින එකක් රු.1,435,000 බැගින් ටාටා සිංගල් කැබ් රථ 05 ක්ද, 2016 ඔක්තෝබර් 05 දින කැබ් රථ 10 ක්ද වශයෙන් වායු සමනය නොකළ සිංගල් කැබ් රථ 15 ක් රු.21,525,000 ක වටිනාකමකට මිලදී ගෙන තිබුණි.

මෙම මිලදී ගැනීම්වලට අදාල ප්‍රසම්පාදන තුළ පහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ බැහැරවීම් නිරීක්ෂණය විය.

(අ) 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී/28 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය අනුව, රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගන්නේ නම් ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද, රු. 21,525,000 ක් වටිනා කැබ් රථ 15 ක් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙන් හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවෙන් සිංගල් කැබ් රථ 05 ක් පමණක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද, වටිනාකම රු. 14,350,000 ක් වූ සිංගල් කැබ් රථ 10 ක් එම අනුමැතිය ඉක්මවා යමින් මිලදී ගෙන තිබුණි.

(ඇ) විගණනය විසින් මෙම වාහනයේ සැපයුම්කරුගේ මිල ගණන් සම්බන්ධයෙන් රැස් කර ගත් වෙළඳපොළ තොරතුරු අනුව එහි වෙළඳපොළ මිල රු. 1,340,000 බවත් එම වර්ගයේ වායු සමනය කළ කැබ් රථයක වෙළඳ පොළ මිල රු. 1,425,000 ක් බවත් අනාවරණය විය. මෙම මිල ගණන් 2016 නොවැම්බර් 01 දින දක්වා පැවති අතර, මේ අනුව ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය වායු සමනය කළ කැබ් රථයක මිල වන රු.1,425,000 වත් වඩා වැඩි වටිනාකමක් ගෙවමින් වායු සමනය නොකළ කැබ් රථ මිලදී ගැනීම නිසා එක් රථයකට රු. 95,000 බැගින් කැබ් රථ 15 සඳහා රු. 1,425,000 ක් අදාල සැපයුම්කරුට වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව සිදුවූ අලාභයේ වටිනාකම එම වර්ගයේ වායු සමනය කළ සිංගල් කැබ් රථයක

වටිනාකමට සමාන වන හෙයින් මෙම මිලදී ගැනීම තුල විධි විරෝධී ක්‍රියාවන් සිදු වී තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) තවද, මෙම මිලදී ගැනීම, 2006 ජනවාරි මස 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් නිකුත් කරන ලද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත ඡේදයන්හි විධිවිධානයන්ට පටහැනිව සිදුකර තිබුණි.

i. 2.14 ඡේදය

රු.මිලියන 21.525 ක් වටිනා මෙම ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමේදී රේඩියෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවෙ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.

ii. 2.7.5 ඡේදය

මෙම මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදුන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තුල අමාත්‍යාංශය ලේකම් විසින් පත්කරන ලද අමාත්‍යාංශයේ සාමාජිකයෙකු ඇතුලත් වී නොතිබුණි.

iii. 2.8.4. ඡේදය

තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා අවම වශයෙන් එක් සාමාජිකයෙකුවත් රේඩියෝ අමාත්‍යාංශයෙන් පත් කළ යුතු වුවත්, සාමාජිකයන් තිදෙනාම සංස්ථාවෙ නිලධාරීන්ගෙන් සමන්විත වී තිබුණි.

iv. 3.2.2 (අ) ඡේදය

ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමේදී ජාතික තරඟකාරී මිල ක්‍රමය අනුගමනය කරමින් එක් ජාතික පුවත්පතකවත් දැන්වීමක් පළකර අදාල මිලදී ගැනීම සිදුකළ යුතු වුවත් රු.21,525,000 ක් වන මෙම ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමේදී අන්තර්ජාලයෙන් තෝරාගත් සැපයුම්කරුවන් තුන් දෙනෙකුගේ මිල ගණන් පදනම් කර ගනිමින් මිලදී ගැනීම සිදුකර තිබුණි.

v. කැබ් රථ 05 ක් සඳහා ආයතනය විසින් රු.444,000 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් කැනපි (Canopy) සවිකරවාගෙන තිබුණු අතරව් සඳහා කිසිදු මිල කැඳවීමක් සිදුකර නොතිබුණි. තවද, මෙම කාර්යය ආයතනයේ කුරුණෑගල හා මහියංගණ වැඩහල් මගින් සිදු කරවා ගැනීමට අවස්ථාව තිබියදී බාහිර ආයතනයන්ට මුදල් ගෙවීම පිළිබඳව විගණනයේදී ප්‍රශ්නගත තත්වයක් පැවතුණි.

3.2 ජෙනරේටරයක් මිලදී ගැනීම (Power Generators-ගොනු අංකය SDFQ/2015/529)

උක්ත මිලදී ගැනීම සඳහා DIMO (pvt) Ltd, Mackwoods Energy PLC, W.Punchibanda&Sons (pvt) Ltd, General Sales Company (pvt) Ltd, United Tractor &Equipment (pvt) Ltd, Browns &Company PLC, Heyleys Industrial Solution (pvt) Ltd හා Koopair (pvt) Ltd යන ආයතන වලින් මිල ගණන් කැඳවා තිබුනු අතර United Tractor &Equipment (pvt) Ltd හා W. Punchibanda & Sons (pvt) Ltd යන ආයතන 02 න් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

ඉදිරිපත් වූ මිල ගණන් අනුව W.Punchibanda & Sons (pvt) Ltd වෙතින් රු.1,215,999 ක වටිනාකමට ජෙනරේටරයක් මිලදී ගැනීමේ හැකියාව පැවතුන ද, උඩවලව ව්‍යාපෘතියේ හදිසි අවශ්‍යතාවය යැයි සලකා Browns & Company PLC වෙතින් රු. 1,450,650 ක වටිනාකමට උක්ත මිලදී ගැනීම සිදු කොට තිබුණි. ඒ හේතුවෙන් ආයතනයට රු. 243,651 ක අලාභයක් සිදුව තිබුණි.

3.3 සූර්ය පැනල පද්ධතියක් මිලදී ගැනීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 ඡේදයේ සඳහන් ජාතික තරඟකාරී මිල ක්‍රමයට මුළුමනින්ම පටහැනිව Manahara Lanka (pvt) Ltd වෙතින් පමණක් මිල ගණන් ලබා ගෙන රු. 163,305 ක වටිනාකමකින් යුත් මෙම මිලදී ගැනීම සිදුකර තිබුණු අතර මෙම මිලදී ගැනීම ප්‍රසම්පාදන කමිටුව හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කොට නොතිබුණි.

3.4 කාර්යාල උපකරණ මිලදී ගැනීම

රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (ආ) වගන්තිය ප්‍රකාරව මිල සැදැහුම් සැසඳීමේදී ජාතික තරගකාරී ලංසු පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු වුවද, රු.1,155,630 ක වටිනාකමකින් යුත් කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේදී Singer Sri Lanka PLC, D.R. Industries (Pvt) Ltd හා Alpha Industries (Pvt) Ltd යන ආයතන 03 න් පමණක් මිල ගණන් ලබාගෙන තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 ඡේදය ප්‍රකාරව මෙම මිලදී ගැනීමට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේ වාර්තාවක් පිළියෙල කර, සියලු සනාථ කිරීමේ ලේඛන සහිතව එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.

තවද, අදාල මිලදී ගැනීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ පොදු දුර්වලතා

පහත සදහන් දුර්වලතා ඉදිරිපත් කෙරේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා මිලදී ගැනීමට අපේක්ෂිත කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවද සංස්ථාව විසින් එසේ සිදුකර නොතිබුණු අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(ආ) උක්ත සංග්‍රහයේ 3.4.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමක් හෝ එම ලියාපදිංචිය යාවත් කාලීන කර ගැනීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 ඡේදය ප්‍රකාරව සැපයුම්කරුවන් විසින් සපයන ලද භාණ්ඩ අදාල පිරිවිතර සමග සැසදෙන බව සහතික කල යුතු වුවද, බොහෝ මිලදී ගැනීම සම්බන්ධයෙන් එසේ සිදු කොට නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය ප්‍රකාරව රු.500,000 ඉක්මවන ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් සමග විධිමත් ගිවිසුමකට එලඹිය යුතු වුවද, උක්ත මිලදී ගැනීම් කිසිවක් සඳහා එසේ ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

4. යන්ත්‍රෝපකරණ හා වාහන භාවිතය

4.1 ආයතනය විසින් 2016 ජූනි මාසයේ දී ස්ථාවර වත්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කොට තිබුනු අතර ඒ අනුව ආයතනයේ වූ යන්ත්‍රෝපකරණ 187 ක් අතරින් 55 ක් පමණක් භාවිතයේ පවතින බවත් ඉතිරිය අලුත් වැඩියා මට්ටමේ හා භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බවත් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| යන්ත්‍රෝපකරණ හා වාහන වර්ගය | මුළු ඒකක ප්‍රමාණය | ඒකකයක වටිනාකම (රු.) | මුළු වටිනාකම (රු.) | මේ වන විට භාවිතයේ පවතින ඒකක ගණන | අළුත්වැඩියා මට්ටමේ පවතින ඒකක ගණන | භාවිතා කල නොහැකි මට්ටමේ පවතින ඒකක ගණන |
|---|---|---|---|---|---|---|
| Motor Grader | 43 | 2,231,052 | 95,935,236 | 13 | 5 | 25 |
| Crawler Tractor (Dozer) | 22 | 2,772,846 | 61,002,612 | 7 | 4 | 11 |
| Loader Backhoe | 20 | 1,305,442 | 26,108,840 | 2 | 18 | |
| Vibrating Roller | 46 | 1,452,076 | 67,372,348 | 13 | 36 | |
| Vibrating Roller | 3 | 192,284 | | | | |
| Wheel Tractor | 6 | 208,278 | 1,249,668 | 1 | 5 | |
| Water Bowser | 2 | 38,262 | 76,524 | 1 | 1 | |
| Trailer Tractor | 1 | 32,091 | 32,091 | | 1 | |
| UD Nissan Lorry | 14 | 1,447,363 | 20,263,082 | 9 | 2 | 3 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| TATA Lorry | 30 | 239,286 | 7,178,580 | 9 | 5 | 16 |
| | 187 | | 279,218,981 | 55 | 77 | 55 |
| | ==== | ====== | ======== | == | == | == |

(අ) ඉහත යන්ත්‍රෝපකරණ අයිතම තුල වූ Motor Grader යන්ත්‍ර 25 කට අදාල කොටස් නැවත භාවිතා කිරීමට නොහැකි මට්ටමේ පැවතීම නිසා පැලියගොඩ රාජ්‍ය ඉංජිනේරු සංස්ථා භූමියේ අනාරක්ෂිතව ගොඩගසා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ මිලදී ගනු ලැබූ සිංගල් කැබ් රථ 05 ක් මහියංගන හා කුරුණෑගල කාර්යාලවලට මුදාහැරීමට ප්‍රවාහන අංශය කටයුතු කර තිබුණද, එම ප්‍රාදේශීය කාර්යාල වලින් අදාල වාහන හා ඒවායේ උපකරණ කට්ටල හා ලියවිලි බලය පැවරූ නිලධාරීන් විසින් පරීක්ෂා කර භාරගත් බවට තහවුරු කොට නොතිබුණි.

(ඇ) කුලී පදනම මත සැහැල්ලු වාහන 03 ක් කුලියට ගෙන තිබුණි. ඒ තුල වූ 252-6101 දරණ වෑන් රථය 2016 මැයි 25 සිට 2017 මැයි 24 දක්වා කාලයක් සඳහා 2016 අගෝස්තු 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ 06 වන කොන්දේසියට අනුව වාහනයේ පැන නගින අළුත්වැඩියා කටයුතු වාහනයේ අයිතිකරුගේ වියදමින් සිදු කල යුතු බව දක්වා තිබුණද, 2016 අගෝස්තු 15 දින එහි අළුත්වැඩියා කටයුතු රු. 9,016 ක මුදලක් දරා ආයතනය විසින් සිදු කොට තිබුණි.

(ඈ) කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී විවිධ පාර්ශව වලින් ලබා ගන්නා ලද මිල ගණන් කැඳවීමට අදාලව විස්තර කිසිවක් ගොනු ගත කර නොතිබුණි.

ජාතික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සංවිධානය සම්බන්ධයෙන් සිදුකරන ලද සීමිත විගණනයට අනුව මෙම ආයතනයේ සියළුම මෙහෙයුම් කටයුතු ඉතා අවිධිමත් හා විධි විරෝධී අයුරින් සිදුවන බැවින් මෙම කටයුතු නිවැරදිවීම හා අනාවරණය වී ඇති මුදල් අවභාවිතාව හා අලාභ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳ නොපමාව විගණනය වෙත දන්වා එවීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඩී.එන්. පීරිස්,
විගණන අධිකාරි,
සහකාර විගණකාධිපති (CEN/CTP) වෙනුවට.

පිටපත් :- 01. ලේකම්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.
02. සභාපති, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය.

ඇමුණුම 01

| දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | වටිනාකම |
|---|---|---|---|
| | | | (රු.) |
| 2016.02.16 | 0197 | 038562 | 100,000 |
| 2016.03.11 | 0312 | 038689 | 250,000 |
| 2016.03.11 | 0313 | 038689 | 500,000 |
| 2016.03.24 | 0409 | 109236 | 300,000 |
| 2016.04.05 | 0463 | 109156 | 350,000 |
| 2016.07.15 | 1044 | 612902 | 100,000 |
| 2016.07.20 | 1057 | 612914 | 20,000 |
| 2016.08.04 | 1168 | 268789 | 100,000 |
| 2016.08.11 | 1169 | 268789 | 100,000 |
| 2016.09.14 | 1352 | 323347 | 700,000 |
| 2016.10.11 | 1480 | 323433 | 500,000 |
| | | | 3,020,000 |